www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ පොලීසිය සසප ආධාරකරුවාගේ ඝාතනය පිලිබඳ පරීක්ෂන ප්‍රමාද කරයි

## Sri Lankan police drag out their inquiries into the murder of SEP supporter

**සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශය**
**2007 ජනවාරි 19**

ශ්‍රී ලංකාවේ නැගෙනහිර පලාතේ මුල්ලිපොතන නගරයේ දී සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) ආධාරකරුවෙකු වූ සිවප්‍රගාසම් මරියදාස් ඝාතනය කරනු ලැබ මාස පහකටත් වැඩි කාලයක් ගතවී ඇතත් ඝාතකයන් අත්අඩංගුවට ගෙන ඔවුන්ට එරෙහිව චෝදනා ගොනු කරනවා තබා ඔවුන්ව හඳුනා ගැනීමටවත් පොලීස් පරීක්ෂන අසමත්ව ඇත. පරීක්ෂනවල නිරත වී සිටින පොලීසිය, සිද්ධියේ සැකකරුවන් වීමට බොහෝ සෙයින් ඉඩ ඇති අය - රටෙහි ආරක්ෂක හමුදා - පිලිබඳ බැරෑරුම් පරීක්ෂනයක් කරනවාට වඩා සිද්ධියේ වගකීමෙන් වැලකී සිටීමට අදිටන් කර ගෙන සිටී.

මේ වන විට අවම වසයෙන් එකිනෙකට වෙනස් නගර තුනක වෙනස් ප්‍රධාන පරීක්ෂකයන් හතර දෙනෙකු අතට පරීක්ෂනය මාරු වී ගොස් ඇත. ජනවාරි 11 දා ත්‍රිකුනාමලයෙන් පැමිනි පොලිස් නිලධාරින් මරියදාස්ගේ බිරිඳ වූ ස්ටෙලා ක්‍රිශාන්ති මරියදාස්ගෙන් නව ප්‍රකාශයක් සටහන් කර ගැනීම මගින් තවත් අපගමනයක් පැහැදිලි විය. පොලීසිය සසපට ප්‍රකාශ කලේ දැන් පරීක්ෂන මෙහෙයවන්නේ ත්‍රිකුනාමලය විශේෂ අපරාධ කොට්ඨාසය විසින් බවයි.

අගෝස්තු 7 දා රාත්‍රී 9.30ට පමන මුල්ලිපොතන පිහිටි මරියදාස්ගේ නිවසේ දී ඔහුව ඝාතනය කෙරුනි. දොර වෙත කැඳවනු ලැබූ ඔහුට හිස සහ බෙල්ල හරහා යන ලෙස වෙඩි තැබීමෙන් ඝාතනය සිදු කරන ලදී. තමන් එන තෙක් බලා සිටි මෝටර්සයිකලයක නැගී ආධාරකරුවෙකු ද සමග තුවක්කුකරු පලා ගියේ ය. ඝාතනයේ වෘත්තීයමය ස්වභාවය, ඝාතකයන් තම ගොදුරේ නම දැන සිටීම සහ මුර සංචාරයකයන් මග හරිමින් මාර්ග බාධක තුලින් ගමන් කිරීමට ඝාතකයන්ට තිබූ හැකියාව යන මේ සියල්ල පෙන්නුම් කරන්නේ මිලිටරිය මෙයට ඇති සම්බන්ධතාවයි.

ඝාතනය සිදු වූයේ ආසන්න මුතූර් සහ මාවිල්ආරු ප්‍රදේශවල දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහිව දරුනු ගැටුම් සිදුවෙමින් පවත්නා අතරතුරේ ය. 2002 සටන් විරාම ගිවිසුම විවෘතව උල්ලංඝනය කරමින් ජනාධිපති මහින්ද රාජපක්ෂ ප්‍රහාර දියත් කොට මාවිල්ආරු සොරොව්ව අල්ලා ගැනීම සඳහා මිලිටරියට නියෝග කොට තිබුනි. යුද්ධයටත් හමුදාවේ සංහාරයන්ටත් එරෙහි වූවකු ලෙස ප්‍රසිද්ධියට පත්ව සිටි මරියදාස් තම ඡායාරූප හා සන්නිවේදන මධ්‍යස්ථානය පවත්වා ගෙන ගිය මුල්ලිපොතනට පැමින ටික කලක් ගතවූවා පමනි.

මරියදාස්ගේ ඝාතකයන් අත්අඩංගුවට ගෙන ඔවුන්ට එරෙහිව චෝදනා ගොනු කිරීම සඳහා බල කිරීමට සැප්තැම්බර් මාසයේ දී සසප හා *ලෝක සමාජවාදී වෙබ් අඩවිය (ලෝසවෙඅ)* ජාත්‍යන්තර උද්ඝෝෂනයක් දියත් කලහ. එහෙත් විවිධ දඟර දැමීම් හා රැවටීම්වලින් පෙන්නුම් කරන ආකාරයට බැරෑරුම් පොලිස් පරීක්ෂනයක් සිදු වී නොමැත.

- මුලදී, පරීක්ෂනය භාරව සිටියේ තඹලගමුව පොලිසියයි. මහේස්ත්‍රාත් පරීක්ෂනයේ දී ද සාක්ෂ්‍ය දුන් මරියදාස්ගේ බිරිඳ වන ස්ටෙලා ක්‍රිෂාන්තිගෙන් ආකාරගත ප්‍රකාශනයක් ඔවුහු ලබා ගත්හ. වරින්වර තඹලගමුවෙන් පැමිනි නිලධාරීහු පරීක්ෂනයේ "ප්‍රගතිය" පිලිබඳ නව වාර්තා ගොනු කිරීම සඳහා උසාවියේ පෙනී සිටියහ. ඇත්තට ම නම් කිසිවක් සිදු නොවුනි.
- මාසයකට පසුව, එනම් සසප උද්ඝෝෂනය ආරම්භ කිරීමෙන් පසුව, කන්තලේ පොලීසියේ පොලිස් පරීක්ෂකවරයෙකු වූ රොඩ්රිගෝ, ස්ටෙලා ක්‍රිෂාන්තිට පැවසුවේ පරීක්ෂනය කර ගෙන යන ලෙස කොලඹින් තමන්ට නියම කොට ඇති බවයි. ත්‍රිකුනාමලයට පැමිනි ඔහු ඇයගෙන් තවත් ප්‍රකාශයක් වාර්තා කර ගත්තේ ය.
- ඊ ලඟ මාසයේ දී කන්තලේ අපරාධ කොට්ඨාශයේ ම පොලිස් පරීක්ෂක කොට්ටච්ආරච්චිව පරීක්ෂනයේ ප්‍රධානියා ලෙස පත් කරන ලදී.

- නොවැම්බර් 20, කන්තලේ මහේස්ත්‍රාත් අධිකරනයට මෝසමක් ඉදිරිපත් කරමින්, ත්‍රිකුනාමලය අපරාධ පරීක්ෂන කොට්ඨාසය (සීඅයිඩී) තමන් පරීක්ෂන භාර ගන්නා බව නිවේදනය කලේ ය. මේ පිලිබඳව කන්තලේ පොලිස් කන්ඩායමට දනුම් දී තිබුනු බවක් පෙනෙන්නට නො තිබුනු අතර ඔවුහු මරියදාස්ගේ බාල සහෝදරයා වූ ජේසුදාස් සිවප්‍රගාසම් ගෙන් ප්‍රකාශයක් සටහන් කර ගැනීම සඳහා නොවැම්බර් 25දා නගරයට පැමිනෙන ලෙස ඉල්ලා සිටියහ.

සසප විසින් විමසන ලදුව ත්‍රිකුනාමලය පොලීසියේ සැරයන් පී.ඒ.එන්. පෙරේරා කියා සිටියේ විරෝධතා ලිපි හා පෙත්සම් ලැබීමෙන් පසු ශ්‍රී ලංකාවේ පොලිස්පතිවරයා පරීක්ෂනය කර ගෙන යාමට ත්‍රිකුනාමලය අපරාධ පරීක්ෂන කොට්ඨාසයට නියෝග කොට ඇති බවයි. පොලිස් පරීක්ෂක එම්.ජී. කුඩාගොඩගේ පරීක්ෂන මෙහෙයවන බව විස්තර කල පෙරේරා එය "රහස් පරීක්ෂනයක්" වන බැවින් කිසිදු තොරතුරක් පිටතට දිය නොහැකි බව කියා සිටියේ ය.

ස්ටෙලා ක්‍රිෂාන්ති මේ වන විට පොලීසියට ප්‍රකාශ තුනක් දී ඇත. එහෙත් සාක්ෂ්‍යකරුවන් සොයාගැනීමට හෝ මරියදාස්ගේ ආසන්න ම පවුලෙන් හැර වෙනත් කිසිවකුගෙන් ප්‍රකාශ ගැනීමට පොලිස් පරීක්ෂක උත්සාහ ගෙන ඇති බවට කිසිදු සාක්ෂ්‍යයක් නැත. මරියදාස් ඝාතනයට ලක් කල උන්ඩවල ස්වභාවය ද අන්තර්ගත මූලික අධිකරන වෛද්‍ය විශ්ලේෂනය මෙතෙක් සිදු කොට නොමැත. දිගින් දිගට ම පරීක්ෂනයේ ප්‍රධානීන් මාරු කිරීම මගින් වගකීම කර හැරීම සුරක්ෂිත කරනවා පමනක් නොව එක ම ක්‍රියාව ද්විත්වකරනය සාක්ෂ්‍ය නැති වී යාමට හා ප්‍රමාද කිරීමට යොදන උපක්‍රමයක් ද වේ.

## මරන තර්ජනය

මිලිටරිය මෙම ඝාතනයට සම්බන්ධ බවට ගම්‍ය කෙරෙන තවත් සාක්ෂ්‍ය සසප සතුව ඇත. තමන්ගේ ඝාතනයට මාස 4කට පෙරාතුව මරියදාස්ට මරන තර්ජන එල්ල වී තිබුන බව ලෝසවෙඅ දනටමත් වාර්තා කොට ඇත. සිදු වූයේ කුමක් දැයි පිලිබඳ තොරතුරු ලබා දීමට දන් ඇසින් දුටු සාක්ෂ්‍යකරුවෙක් ඉදිරිපත්ව ඇත.

මුල්ලිපොතනට කිලෝමීටර් 10ක් පමන දුරින් ත්‍රිකුනාමලය හබරන මාර්ගයේ සිදු වූ ක්ලේමෝ බෝම්බ පිපිරීමකින් නාවික භටයන් 11 දෙනෙකු ඝාතනය වූයේ යන ප්‍රවෘත්තිය පැතිරීමෙන් පසු අප්‍රේල් 11 දා මෙම සිද්ධිය සිදු විය. මධ්‍යාහ්නය ආසන්නයේ මරියදාස් තමන්ගේ ඡායාරූප ශාලාවට පැමිනීමෙන් ටික වේලාවකට පසු යුද හමුදා ට්‍රක් රථයක් නතර කොට එක් පුද්ගලයෙකු බස්සන ලදී. සියලු දෙනා සිවිල් ඇඳුමින් සැරසී සිටියහ.

ඡායාරූප ශාලාවට ඇතුල් වූ තැනැත්තා සිංහල භාෂාවෙන් මරියදාස්ට "උඹ එල්ටීටීඊයට තොරතුරු දෙනවා. මම උඹව ජීවතුන් අතර තියන්නෙ නැහැ. යයි කියමින් පරිභව කලේ ය. ඇසින් දුටු සාක්ෂ්‍යකරු තව දුරටත් කීවේ: "අපෝ මම බය වුනා. මම හිතුවේ මරියදාස්ව එවේලේ ම මරා දමයි කියලා. ඔහු මරියදාස්ගේ මුහුනට පහර දුන්නා මා ඔහුව පුද්ගලිකව හඳුනන්නේ නැහැ. ඔහු කලුයි, එතරම් උස නැහැ. සොල්දාදුවෙකුගේ වැනි කොට කොන්ඩයක් ඔහුට තිබුනා. ඔහු ටී-ෂර්ට් එකක් හා කලිසමක් ඇඳ සිටියා."

ඇසින් දුටු සාක්ෂිකරු ම කියන පරිදි මරියදාස් නිශ්ශබ්දව සිටි අතර මරන තර්ජන පිලිබඳව එතරම් බැරෑරුම්ව සැලකූ බවක් පෙනෙන්නට නො තිබුනි. ග්‍රාමාරක්ෂකයෙකු තමන්ට තර්ජනය කල බවත් ඡායාරූප ශාලාව පවත්වා ගෙන යන ගොඩනැගිල්ලේ හිමිකාර ජයවීර එම තැනැත්තාට කතා කොට ඇති බවත් මරියදාස් තම නැන්දනියකට කියා තිබුනි. විශ්‍රාම ලත් ග්‍රාම නිලධාරියෙකු වන ජයවීර මීට කලින් සසපට කියා සිටියේ "ටොම්බා" යන අන්වර්ථ නම ඇති ග්‍රාමාරක්ෂකයෙක් මරියදාස්ගේ සන්නිවේදන මධ්‍යස්ථානය "සමතලා කරන" බවට තර්ජනය කොට තිබුනු බවයි. පොලීසියේ සහායකයන් ලෙස ග්‍රාමාරක්ෂකයෝ ක්‍රියා කරති.

මරියදාස්ගේ ඝාතනයෙන් ක්ෂනිකව ඉක්බිත්තේ ඔහු එල්ටීටීඊ ආධාරකරුවකු වීය යන කටකතාව ප්‍රාදේශීය සොල්දාදුවෝ, පොලීසිය හා ග්‍රාමාරක්ෂකයෝ විසින් පතුරුවා හලහ. මරියදාස්ගේ බිරිඳ කියන පරිදි ඇය නැවතී සිටින අසල්වැසි නිවසකට පැමිනි ග්‍රාමාරක්ෂකයෝ ඇයට කෑගසා එල්ටීටීඊය අනෙක් සියලු දෙනා ඝාතනය කරමින් පලි ගනු ඇතැයි අනතුරු හැඟවූහ. මරියදාස් එල්ටීටීඊයට සහයෝගය දක්වූවේයැයි කියා සිටීම අමූලික බේගලයකි. වසර පහක් පුරා සසප සමග සබඳතා පැවැත්වූ ඔහු, ලෝසවෙඅ මාධ්‍යවේදීන්ට සහාය දක් වී ය. ඔහු සසප දේශපාලන ක්‍රියාකාරකම්වල විවෘතව නිරත නොවූවත් එල්ටීටීඊයටත් එහි දෙමල බෙදුම්වාදී ඉදිරිදර්ශනයටත් ඔහුගේ විරුද්ධත්වය පිලිබඳව ඔහු සුප්‍රකට විය.

මරියදාස් ඝාතනය වනාහි රාජපක්ෂ ආන්ඩුව එල්ටීටීඊයට එරෙහි තම යුද්ධය තීව්‍ර කල තතු තුල පසු ගිය වසරේ සිදු වූ ඝාතන සිය ගනනකින් එකක් පමනි. මිලිටරිය තම සහායක සන්නද්ධ

කන්ඩායම් ද සමග සහයෝගයෙන් කොලඹ මෙන් ම දිවයිනේ උතුරේ හා නැගෙනහිරේ ඝාතක කල්ලි ක්‍රියාත්මක කර ඇති බව විවෘත රහසකි. "එල්ටීටීඊ සැකකරුවන්" පැහැරගෙන යාම හා ඝාතනය කිරීම දෙමල ජනතාව ත්‍රස්ත කිරීමේ උපක්‍රමයකි. අද දක්වා ම ඝාතකයෝ විපාක විඳීමකින් තොරව ක්‍රියාකාරී වී ඇත. කෲරතම ම්ලේච්ඡ ක්‍රියාවන්ට දක්වන ප්‍රතිචාරයක් ලෙස පරීක්ෂනයක් පවත්වන බවට පොරොන්දු වීමට ජනාධිපති රාජපක්ෂට බලකෙරී ඇතත් මේ ඝාතනවලින් කිසිවක් සම්බන්ධයෙන් කිසිවෙක් අත් අඩංගුවට ගනු ලැබ හෝ චෝදනා එල්ල කෙරී නොමැත.

වඩාත් මෑත දී සිදු වූ සිද්ධිවලින් එකක දී නැගෙනහිර විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය සිවසුබ්‍රමනියම් රවීන්ද්‍රනාත්ව දෙසැම්බර් 15දා කොලඹ දී පැහැරගනු ලැබී ය. අති සන්නද්ධ මිලිටරි හා පොලිස් භටයන් විසින් ආරක්ෂා කරනු ලබන අගනුවර අධි ආරක්ෂක කලාපවලින් එකක දී ඔහුව පැහැර ගනු ලැබීය. මෙතෙකුදු ඔහුව නිදහස් කර නොමැත. පොලීසිය කියන ආකාරයට ඔහුව පැහැර ගත්තේ කවුරුන් දැයි නොදනී.

මරියදාස්ගේ ඝාතකයන් අත් අඩංගුවට ගෙන චෝදනා ඉදිරිපත් කරන ලෙස ශ්‍රී ලංකාවේ අධිකාරීන්ට බල කරමින් ලිපි එවා ඇති අපගේ ආධාරකරුවන්ට හා ලෝසවෙඅ පාඨකයන්ට අපි ස්තුතිය පිරිනමමු. එසේ වුවත් මෙම උද්ඝෝෂනය තීව්‍ර කිරීමට අවශ්‍යය. මරියදාස්ටත් ඔහුගේ පවුලටත් සාධාරනය ඉල්ලා සිටීම මගින් මෙම ඝාතක කල්ලිවලට හා ඔවුන්ගේ ක්‍රමානුකූල වහංගු කිරීම්වලට එරෙහිව දැඩි ප්‍රහාරයක් එල්ල වේ. මෙම උද්ඝෝෂනය සිංහල දෙමල හා මුස්ලිම් යන සියලු ම වැඩ කරන ජනයාගේ මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කර ගැනීමට ගෙන යන පුලුල් අරගලයක අත්‍යවශ්‍ය කොටසකි.

විරෝධතා ලිපි හා ප්‍රකාශන යැවිය යුත්තේ:

පොලිස්පති වික්ටර් පෙරේරා.,
පොලිස්මූලස්ථානය
කොලඹ 1.
ශ්‍රී ලංකාව.
ෆැක්ස්: 0094112446174
ඊ-මේල්: igp@police.lk
නීතිපති කේ.සී. කමලසබේසන්.,
නීතිපති දෙපාර්තමේන්තුව,
කොලඹ 12,
ශ්‍රී ලංකාව.

ෆැක්ස්: 0094112436421

එම ලිපිවල පිටපත් ශ්‍රී ලංකාවේ සසපට හා ලෝසවෙඅ වෙත එවිය යුතුයි.

සමාජවාදී සමානතා පක්ෂය,
තැ.පෙ. 1270,
කොලඹ,
ශ්‍රී ලංකාව.

ඊ-මේල්: wswscmb@sltnet.lk

.